සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## ඉතිහාසය - I

**නම/විභාග අංකය :--** ........................................................................ **කාලය : පැය 01 යි.**

සැලකිය යුතුයි :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ඇති පිළිතුරු පත්‍රයේ අදාළ කවය තුළ (X) සලකුණ යොදන්න.

---

(01) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් ලෙස ගැනෙන නිකාය සංග්‍රහය මගින්,
(1) ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය හැදෑරිය හැකි ය.
(2) ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු හදෑරිය හැකි ය.
(3) දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරු හැදෑරිය හැකි ය.
(4) මහාවංශයේ ඇතැම් කරුණු පිළිබඳ අර්ථ විවරණය සඳහා යොදා ගත හැකි ය.

(02) ගල් තලාවක හෝ ගල් කුළු මත ලියූ ලිපි හඳුන්වන්නේ,
(1) ලෙන් ලිපි නමිනි. (2) ටැම් ලිපි නමිනි. (3) ගිරි ලිපි නමිනි. (4) පුවරු ලිපි නමිනි.

(03) ''ශිලා මංජුසා සොහොන් සොයාගෙන ඇති ස්ථානයකට නිදසුනකි,
(1) පාහියන් ගල (2) උඩරංචාමඩම (3) හල්දුම්මුල්ල (4) ඉබ්බන්කටුව

(04) ලංකාවට නොපැමිණි වුව ද අපේ රට පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ විදේශිකයා වන්නේ,
(1) ටොලමි ය. (2) රොබට් නොක්ස් ය. (3) රිබෙයිරෝ ය. (4) පිලිප්පස් බැල්ඩියස් ය.

(05) අතීත පාලන කටයුතු සඳහා කාන්තාවන්ගේ දායකත්වය ද ලැබී ඇති බවට සාධක ඇත. එවැනි කාන්තා නායිකාවන් හැඳින්වීම සඳහා භාවිතා කළ නාමය කුමක් ද?
(1) මපුරුමුකා (2) බතගු (3) පරුමක (4) පරුමකලු

(06) පරිසර හිතකාමී ලෙසත් අලංකාර ලෙසත් උයන් නිර්මාණය සඳහා තාක්ෂණික ඥානය යොදා ගත් බවට දිය හැකි නිදසුනක් වන්නේ,
(1) මහමෙව්නා උයන (2) සීගිරි උද්‍යානය (3) රන්මසු උයන (4) නන්දන උයන

(07) යකඩ නිස්සාරණය සඳහා පැරණි තාක්ෂණය භාවිතා කිරීමේ දී ස්වාභාවික සුළං බලය යොදාගෙන ඇත. එවැනි ස්ථානයකට නිදසුන් වන්නේ,
(1) දෙහිගහ ඇලකන්ද (2) බෙරගල (3) සමනල වැව (4) අල්ගල

(08) අතීතයේ දී මෙරට ක්‍රියාත්මක වූ විදේශීය වෙළඳ සංවිධානයකට අයත් ලෝහ මුද්‍රාවක් හම්බන්තොටින් සොයාගෙන ඇත. එය අයත් වන්නේ කුමන විදේශීය වෙළඳ සංවිධානයට ද?
(1) නානාදේසි (2) අයින්නුරුවර් (3) වලඤ්ඤියාර් (4) කාම්බෝජවරු

(09) මුල් ඓතිහාසික යුගයේ ''පටුන්ගම්'' ලෙස හඳුන්වා ඇත්තේ,
(1) ප්‍රධාන ගංගා මුහුදට වැටෙන ස්ථානවල පිහිටි වරායයන්
(2) නැව් තොටු ආශ්‍රිතව පිහිටි ගම්
(3) වෙළඳාමට භාණ්ඩ රැස්කළ ගම්
(4) වෙළඳුන් නවාතැන් ගන්නා ස්ථානවල පිහිටි ගම්

(10) පංච කකුධ භාණ්ඩ භාවිතා කොට තම අභිෂේක උත්සවය නැවත වතාවක් සිදු කළ රජතුමා වන්නේ,
(1) පණ්ඩුකාභය රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
(3) දේවානම් පියතිස්ස රජතුමා ය. (4) I විජයබාහු රජතුමා ය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(11) පහත ප්‍රකාශ අතරින් වසභ රජතුමා සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) ලම්බකර්ණ පෙළපතේ ආරම්භක පාලකයා වේ.
(2) බදු අය කිරීම ක්‍රමවත් ලෙස සිදු කළ රජ කෙනෙකි.
(3) විශාල වැව් ඉදිකිරීමේ ආරම්භක පාලකයා වේ.
(4) සැලසුම් සහගත ලෙස සොළින් පලවා හැරීමට ක්‍රියා කළේ ය.

(12) ජය ගඟ හෙවත් යෝධ ඇළ විශිෂ්ඨ වාරි නිර්මාණයක් ලෙස හැඳින්වීමට ප්‍රධාන හේතුව මින් කුමක් ද?
(1) ඇළ නිර්මාණයේ දී භූමියේ බෑස්ම ඉතා සියුම් ලෙස ප්‍රයෝජනයට ගැනීම
(2) එක් වැවකින් තවත් වැවක් පෝෂණය කිරීම.
(3) කුඩා වැව් රාශියක් පෝෂණය කිරීම.
(4) ඇළ මගින් දිගු දුරක් ජලය ගෙන යාම

(13) ගංගා කිහිපයක් හැඳින් වූ පැරණි ගම් හා වර්තමාන ගම් 'අ' හා 'ආ' තීරුවල පිළිවෙළින් දැක්වේ. සුදුසු පරිදි ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. කප්පකන්දර නදිය | A - කිරිඳි ඔය |
| 2. ගාල්හ නදිය | B - වලවේ ගඟ |
| 3. මහා වාලුකා නදිය | C - ගල් ඔය |
| 4. වන නදිය | D - මැණික් ගඟ |
| | E - මහවැලි ගඟ |

(1) A, D, B, C (2) D, C, E, B (3) D, B, C, E (4) D, C, B, E

- පහත දැක්වෙන මිනුම් ක්‍රම ඇසුරින් (14) හා (15) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පරාමාණු B - ගුන්ජා C - අමුණු
D - ධරණ E - කුරුණ F - ආංගුල

(14) ගොවිතැන් කටයුතුවලදී අස්වනු මැනීම සඳහා යොදා ගත් මිනුම් ක්‍රම දෙකකි.
(1) A හා C (2) B හා D (3) A හා F (4) C හා E

(15) දිග මැනීම සඳහා යොදා ගත් මිනුම් ක්‍රම දෙකක් වන්නේ,
(1) A හා B (2) B හා C (3) A හා F (4) D හා F

(16) පැරණි කාසි පිළිබඳව හදාරණ විද්‍යාව හඳුන්වන්නේ කුමන් නමකින් ද?
(1) පුරා විද්‍යාව (2) වාස්තු විද්‍යාව (3) භූගෝල විද්‍යාව (4) නාණක විද්‍යාව

(17) භාතිකාභය රජ සමයේ සිදුවුවා යැයි සඳහන් වන විශේෂ සිදුවීම කුමක් ද?
(1) තානාපතිවරයෙකු රෝමයට යවා වීදුරු පබළු ගෙන ඒම
(2) පාහියන් නම් චීන භික්ෂූන් වහන්සේ මෙරටට වැඩම කිරීම.
(3) දළදා වහන්සේ වැඩම කරවීම
(4) ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා ලංකාවට පැමිණීම

(18) ක්‍රි. ව. 9 වන සියවසේ ලියවුණු සෙල්ලිපියක එක්තැන්සමිය යන යෙදුම භාවිත වූයේ කුමක් හැඳින්වීම සඳහා ද?
(1) විධායකය (2) ව්‍යවස්ථාදායක හා විධායකය
(3) ව්‍යවස්ථාදායකය (4) අධිකරණය

- **පහත වගුවේ දැක්වෙන තොරතුරු අධ්‍යයනය කර 19, 20, 21 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | රජතුමා | ස්ථානය |
|---|---|---|
| A 1521 | D ශ්‍රී වික්‍රම රාජසිංහ | G මහනුවර |
| B 1638 | E II රාජසිංහ | H කෝට්ටේ |
| C 1815 | F VI විජයබාහු | I ගන්නොරුව |

(19) විජයබා කොල්ලයට අදාළ තොරතුරු ඇතුළත් වන්නේ කුමන පිළිතුරේ ද?
(1) A, E, I (2) B, D, G (3) A, F, H (4) A, D, I

(20) උඩරට ගිවිසුමට අදාළ තොරතුරු ඇතුළත් වන්නේ කුමන පිළිතුරේ ද?
(1) B, E, I (2) A, D, G (3) C, E, H (4) C, D, G

(21) පෘතුගීසීන් අන්ත පරාජයකට පත් කළ සටනක් පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
(1) B, F, I (2) B, E, I (3) A, E, I (4) C, E, G



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(22) පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යන ජාතීන් තම ආගම ප්‍රචාරය සඳහා ගෙන ගිය මිෂනාරි ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් සම්බන්ධ වී පැවැතියේ,

(1) අධ්‍යාපනය සමඟ ය  (2) වෙළඳාම සමඟය
(3) දේශපාලනය සමඟය  (4) වගු වගාව සමඟය

(23) ධනපති පංතිය හා කම්කරු පංතිය ලෙස සමාජ බෙදීමක් ඇති වූයේ පහත සඳහන් කුමන කරුණින් ද?

(1) යටත් විජිතවාදය  (2) පුනරුදය
(3) කාර්මික විප්ලවය  (4) දේශගවේෂණය

(24) ක්‍රි. ව. 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත්වීම නිසා සිදු වූ වැදගත් ප්‍රතිඵලය කුමක් ද?

(1) පෘතුගීසින් ලංකාවට පැමිණීම  (2) යුරෝපයේ පුනරුදය ඇතිවීම
(3) වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටීම.  (4) ලෝක සංග්‍රාම ඇතිවීමට බලපෑම.

(25) පහත දක්වා ඇති සාහිත්‍ය කෘති අතරින් කෝට්ටේ යුගයේ රචනා කළ කෘති මොනවා ද?

A - රසවාහිනි  B - මයුර සංදේශය
C - ගුත්තිල කාව්‍යය  D - කාව්‍යශේඛරය  E - කව් සිළුමිණ

(1) A, C  (2) B, D
(3) B, C  (4) C, D

(26) කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ සිදුවූ වැදගත් සිදුවීමක් වන්නේ කුමක් ද?

(1) වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ උපදෙස් අනුව රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම.
(2) බුරුම දේශයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වා උපසම්පදාව යළි ස්ථාපිත කිරීම.
(3) ලන්දේසීන් උඩරටට ඇතුලු වීම වැළක්වීම.
(4) පෘතුගීසින් මෙරටින් පලවා හැරීමට කටයුතු කිරීම.

(27) පහත ප්‍රකාශ අතරින් උඩරට රජතුමාගේ බලය සම්බන්ධව **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) රටේ ඉහළම බලය හිමි තැනැත්තා රජතුමා ය.
(2) සම්ප්‍රදාය හා පෙර සිරිතට අනුව රජු ක්‍රියා කළ යුතු යි.
(3) රටේ සියලු ම දේශපාලන, ආර්ථික හා පරිපාලන කටයුතුවල මුල් තැන රජතුමාට හිමි ය.
(4) උඩරටට සම්බන්ධ සියලු ම නඩු විසඳීම හා අපරාධවලට දඬුවම් ලබාදීම රජතුමා විසින් ම සිදු කිරීම.

(28) ''වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල සිහිනැටි වී මිස මුං ඇට වැපිරීම නොකළ යුතු යි.'' යනුවෙන් පැන වූ නීතිය සඳහන් ව ඇත්තේ කුමන සෙල්ලිපියේ ද?

(1) කොණ්ඩවට්ටවාන්  (2) හෝපිටිගමුව  (3) වෙස්සගිරිය  (4) වේවැල් කැටිය

(29) ''විශාල බරක් දැරීමට සුදුසු ලෙස ඉදිකිරීම් සිදු කිරීමට පැරණි වාස්තු විද්‍යාඥයින් ප්‍රවීණතාවය දක්වා ඇත.'' මෙය සනාථ කිරීමට ඇති හොඳ ම සාක්ෂියකි.

(1) මල්වතු ඔයේ ගල් පාලම  (2) රුවල්වැලි සෑයේ අත්තිවාරම
(3) සීගිරියේ රජ මැදුරු සංකීර්ණය  (4) මාදුරු ඔයේ සොරොව්ව

(30) පහත සඳහන් සිදුවීම් අතරින් උඩරට රාජධානිය හා සම්බන්ධ සිදුවීමක් **නොවන්නේ** කුමක් ද?

(1) සිංහල සංගමය ඇතිවීම
(2) දෙල්ගමුව විහාරයේ තිබූ දළදාව මහ නුවරට වැඩම කරවීම.
(3) නව රාජ වංශයක ආරම්භය සිදු වීම.
(4) කොත්මලේ හා වලපනේ ප්‍රදේශවල යකඩ කර්මාන්තය දියුණුවට පත්වීම.

| පහත සඳහන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යෝජනා හා කැපී පෙනෙන ලක්ෂණ අධ්‍යයනය කොට (31), (32) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.
B - ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
C - සීමිත ඡන්ද බලය ලබාදීම.
D - විධායක කාරක සභා පිහිටුවීම.
E - උගත් ලාංකිකයකු- ව්‍යවස්ථාදායකයට පත්කිරීම.

(31) ඉහත යෝජනාවලින් කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාළ යෝජනා මොනවා ද?

(1) A හා C  (2) C හා D  (3) C හා E  (4) B හා D

(32) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කැපී පෙනෙන යෝජනා වන්නේ,

(1) A හා C  (2) B හා D  (3) C හා E  (4) A හා D



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(33) අධිරාජ්‍යවාදීන්ට එරෙහි ව නිදහස දිනා ගැනීමේ සටන සඳහා එක්වූ වාමාංශික නායකයෝ සූරිය මල් ව්‍යාපාරය ඔස්සේ උද්ඝෝෂණ කළහ. මෙම ව්‍යාපාරයට නායකත්වය ලබා දුන්නේ,

(1) සර් ඩී. බී. ජයතිලක
(2) ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා
(3) කොල්වින් ආර් ද සිල්වා
(4) සර් ජේම්ස් පීරිස්

(34) ඉංග්‍රීසි පාලන සමයේ හිතකර මෙන් ම අහිතකර බලපෑම් ද සිදු වූ බව නොරහසකි. පහත ප්‍රකාශ අතරින් අයහපත් බලපෑම් සහිත ප්‍රකාශ මොනවා ද?

A - වතු වගාවට ඉඩම් යෙදවීම තුළින් උඩරට ඉඩම් හිඟයක් ඇති වීම.
B - ජාත්‍යන්තර භාෂාවක් වූ ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට හැකි වීම.
C - බටහිර සංස්කෘතික අංග රටපුරා ව්‍යාප්ත වීම.
D - කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ඉක්මණින් රට තුළට ව්‍යාප්ත වීම.

(1) A හා C
(2) A හා B
(3) B හා D
(4) C හා D

(35) පහත කරුණු අතරින් තේ වගාවේ උන්නතියට බලපෑ හේතුවක් **නොවන්නේ,**

(1) ශ්‍රී ලංකාවේ තේ සඳහා ලෝක වෙළඳපළේ ඉහළ මිලක් ලැබීම.
(2) ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් ම තේ වගාවට හිතකර වීම.
(3) දකුණු ඉන්දීය කම්කරුවන්ගෙන් පහසුවෙන් ශ්‍රමය ලබා ගත හැකි වීම.
(4) ප්‍රවාහන පහසුකම් වැඩි දියුණුවීම තුළින් වෙළඳාම පහසු වීම.

(36) කම්කරු ව්‍යාපාරයේ පුරෝගාමී නායකයකු ලෙස ක්‍රියා කළ අයෙකි.

(1) ඇන්. ඇම්. පෙරේරා
(3) පිලිප් ගුණවර්ධන
(3) ඒ .ඊ. ගුණසිංහ
(4) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක

(37) පහත ලක්ෂණ අතරින් සෝල්බරි ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණය කුමක් ද?

(1) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
(2) ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම.
(3) රාජ්‍ය මන්ත්‍රණ සභාවට ආණ්ඩුකාරවරයා නම් කළ අට දෙනෙක් පත් කිරීම.
(4) රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කිරීම.

(38) බෞද්ධ ආගමික පුනරුද ව්‍යාපාරයට නායකත්වය දුන් භික්ෂූන් වහන්සේලා සිදු කළ කාර්යයන් 'අ' හා 'ආ' තීරුවල දක්වේ. සුදුසු පරිදි ගළපා නිවැරැදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි | A. රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන පිහිටුවීම. |
| 2. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි | B. පංචා මහාවාද සඳහා නායකත්වය දීම. |
| 3. වලානේ සිද්ධාර්ථ හිමි | C. මුද්‍රණාලයක් පිහිටුවීමට ක්‍රියා කිරීම. |
| 4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | D. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම |

(1) C, A, D, B
(2) A, C, B, D
(3) C, D, A, B
(4) C. A. B, D

(39) තේ, රබර්, පොල් යන බෝග වගාවන් සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇති ස්ථාන පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) තලවකැලේ, අගලවත්ත, ලුණුවිල
(2) තලවකැලේ, රත්නපුර, මීද්දෙනිය
(3) අගලවත්ත, ලුණුවිල, තලවකැලේ
(4) මහනුවර, කලුතර, කෑගල්ල

(40) කෝල්බෲක් යෝජනා අතර පෞද්ගලික නිදහසට මග පෑදූ යෝජනාවක් වන්නේ,

(1) දිවයින පළාත් පහකට බෙදීම
(2) රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
(3) අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
(4) උඩරට හා පහත රට ඒකාබද්ධ පාලනයක් හඳුන්වා දීම.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## ඉතිහාසය - II

**නම/විභාග අංකය :-- .................................................................................** **කාලය : පැය 03 යි.**

සැලකිය යුතුයි :

- I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලබාදිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි. පිළිතුරු සඳහා ලකුණු 120ක් හිමිවේ.

### I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) මහාවාලුකා නදිය, නාච්චදූව වැව, පුලස්තිනගර, ඉබ්බන්කටුව, මහනුවර, ගල්ඔය, කැලණිය, ඌරාතොට, හුරුළු ඔය, ගෝකණ්ණ, මහියංගනය, දේවනගර (ලකුණු 12)

(ii) කැලිකට්, ඉන්දියාව, රතු මුහුද, අරාබිය, මහා බ්‍රිතාන්‍යය, තුර්කිය (ලකුණු 06)

(ආ) (i) පහත ABC හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් දක්වන්න.

A - ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා

B - මින්නේරිය වැව ඉදිකළ රජතුමා

C - ආකාරවලට ආලෝකය ලබාගැනීමට ආරක්ෂක ලාම්පුව නිපදවූ පුද්ගලයා

D - ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා (ලකුණු 04)

I A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුර අංක අනුපිළිවෙළින් සඳහන් කරන්න.



(ii) 1. පින්තූරයෙන් දක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2. ඔහු කුමන ජාතිකයෙක් ද?

3. ඔහු විසින් අඳින ලද ලංකාවේ සිතියම නම් කර ඇත්තේ කුමන නමකින් ද?

4. ඔහු විසින් රචනා කරන ලද කෘතියේ නම කුමක් ද? (ලකුණු 04)



(iii) 1. මෙහි සිංහ කොඩිය ඔසවා සිටින භික්ෂූන් වහන්සේගේ නම කුමක් ද?

2. මෙම ඓතිහාසික සිදුවීම සිදුවූ දිනය කවදාද?

3. මෙම අවස්ථාවේ මහනුවර මඟුල් මඩුවේ සිදු වූ සිදුවීම කුමක් ද?

4. මෙම සිද්ධිය හා සම්බන්ධ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවු ද? (ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## II කොටස

(02) (i) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර ලෙස ලබාගත් ශාකමය ආහාර වර්ග දෙකක් හා සත්ත්ව ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ අභිචාරවිධි පිළිබඳ නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) A - මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් හා

B - ගංගාවක පිටාර නිම්නයේ පිටත ප්‍රදේශවල ජනාවාස ව්‍යාප්ත වීමේදී ඒවායේ ජීවත් වූ වැසියන්ගේ යැපීම් ක්‍රමය පිළිබඳ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) රාජ්‍යත්වය පිළිබඳ ආරෝපිත නම් අතීතයේ දී භාවිතා කර ඇත. පහත නම් වලින් හැඳින්වූයේ කුමන රජවරුන්දැයි ABC අනුපිළිවෙළින් දක්වන්න.

A - නරඉසෙර

B - ආලකමන්දාධිපති

C - කාලිංග චක්‍රවර්තී (ලකුණු 03)

(ii) රාජ්‍ය තන්ත්‍රය හා සම්බන්ධ පහත කාර්යයන් භාර නිලධාරීන් ගේ නිල නාමය අනුපිළිවෙළින් දක්වන්න.

A - නාගරික වාස්තු විද්‍යාඥ

B - කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානී

C - වෙළඳ කටයුතු භාර ප්‍රධානී

D - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී (ලකුණු 04)

(iii) අතීතයේ දී ගම් ප්‍රධානීන් විසින් ඉටු කළ කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ''ඓතිහාසික මූලාශ්‍ර අනුව දුටුගැමුණු රජතුමා මෙරට දේශපාලන බලය නිසි අයුරින් සංවිධානය කිරීමට වැදගත් සේවයක් කළ රජ කෙනෙකි.'' කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - රුවන්වැලි සෑය අලංකාර කිරීමට රෝමයෙන් පබලු ගෙන් වූ රජතුමා

B - පොළොන්නරුවේ දළදා මාලිගාවේ ආරක්ෂාව වේලෙක්කාර හමුදාවට භාර කළ රජතුමා

C - ඉන්දියාවේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට සහභාගි වූ ලාංකික පාලකයා (ලකුණු 03)

(ගජබාහු, I විජයබාහු, නිශ්ශංකමල්ල, භාතිකාභය, II විජයබාහු, I පරාක්‍රමබාහු)

(ii) සෙල්ලිපි හා සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් පහත යෙදුම්වලින් කුමක් හැඳින්වේ ද?

A - කිරිගෙරි

B - කෙටුකනබ

C - කබර

D - වණිජ (ලකුණු 04)

(iii) ''පැරණි මුතුන් මිත්තන් යකඩ නිස්සාරණ තාක්ෂණය පිළිබඳව හොඳින් දැන සිටි බවට සාධක ඇත.''

මෙම ප්‍රකාශය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පැරණි ලංකාවේ ජීවත් වූ විවිධ ජනවර්ග සහජීවනයෙන් කටයුතු කළ ආකාරය කරුණු තුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(05) (i) (a) ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත් පළමු පාලන මධ්‍යස්ථානය හා

(b) දෙවන නාගරීකරණයට අයත් පාලන මධ්‍යස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) රජරට පැරණි නගර පරිහානියට පත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රජ බවට පත් වූ I විමලධර්මසූරිය රජතුමා

(a) මුහුණ දුන් අභියෝග දෙකක් හා

(b) එම අභියෝග ජය ගැනීමට ගත් ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ පැවති ආර්ථික ක්‍රමය පිළිබඳ ව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) පහත සඳහන් වගන්තිවලට අදාළ පිළිතුරු A, B, C අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - ශ්‍රී ලංකාවේ අවසාන ලන්දේසි ආණ්ඩුකාරයා

B - ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා

C - ඉංග්‍රීසීන්ට උඩරට යටත් කර ගැනීමට උදවු කළ සිවිල් සේවකයා (ලකුණු 03)

(ii) ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමු වීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(iii) (a) 1818 පළමු නිදහස් සටනට නායකත්වය දුන් දෙදෙනෙක් සඳහන් කරන්න.

(b) පළමු නිදහස් සටන අසාර්ථක වීමට හේතු වූ කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ දී බෞද්ධ නායකයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) ඉංග්‍රීසීන් මෙරට වතු වගාව යටතේ වගා කළ බෝග වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත වර්ෂවල සිදු කළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ හැඳින් වූ නම A, B, C, හා D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - 1833 B - 1910

C - 1920 D - 1931 (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට සිදු වූ සමාජයීය වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා අපට උරුම වූ ප්‍රයෝජනවත් අංග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ සොයාගැනීම් හා නිර්මාණ කිහිපයක් පහත දැක්වේ. A, B හා C අනුපිළිවෙළින් ඒ සඳහා පුරෝගාමී වූ අයගේ නම සඳහන් කරන්න.

A - සිස්ටයින් දෙව්මැදුරේ දේව දරුවන් දෙදෙනාගේ චිත්‍රය නිර්මාණය කිරීම.

B - දුරේක්ෂය සොයා ගැනීම

C - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම. (ලකුණු 03)

(ii) නව මුහුදු මාර්ග සොයාගැනීමේ ගමන සාර්ථක වීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(iii) (a) - පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය විද්‍යාවේ දියුණුවට හේතු වූ සොයා ගැනීම් දෙකක් හා

(b) - පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) ''පුනරුදයේ බලපෑම ලංකාවට ද ලැබී ඇත.'' කරුණු තුනක් ඇසුරින් මෙය සනාථ කරන්න. (ලකුණු 06)

(09) (i) බ්‍රිතාන්‍ය හැරුණු විට කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ''කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස සොයාගත් දේ බොහෝය.'' පහත දක්වා ඇති දේවල් සොයා ගත් පුද්ගලයන් වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - කපු කැටීමේ ජෙනි යන්ත්‍රය

B - වානේ නිපදවීමේ උදුන

C - යපස් උණු කිරීමේ උදුන

D - රූපවාහිනි යන්ත්‍රය

(නිව් කොමන්, ජේම්ස් හාග්‍රිව්ස්, විලියම් සීමන්ස්, ජේම්ස් වොට්, හෙන්රි බෙසමර්, හම්ප්‍රි ඩේවි, ජෝන් ලොගී බෙයාර්ඩ්) (ලකුණු 04)

(iii) ''කාර්මික විප්ලවය කෘෂි කර්මාන්තය කෙරෙහි ද සෘජුව බලපා ඇති අතර කෘෂිකර්මාන්තයෙහි විශාල වර්ධනයක් ද සිදුව ඇත.'' මේ සඳහා බලපෑ සාධක දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ''කාර්මික විප්ලවය හේතුවෙන් සමාජීය අංශයේ සිදු වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)




iexamhub www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය ඉතිහාසය - II


(1) (අ) (i)






iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(1) (අ) (ii)






iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

Answers

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

### 11 ශ්‍රේණිය
### ඉතිහාසය - පිළිතුරු පත්‍රය


## I පත්‍රය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | - | 2 | (11) | - | 4 | (21) | - | 2 | (31) | - | 3 |
| (2) | - | 3 | (12) | - | 1 | (22) | - | 1 | (32) | - | 4 |
| (3) | - | 4 | (13) | - | 2 | (23) | - | 3 | (33) | - | 2 |
| (4) | - | 1 | (14) | - | 4 | (24) | - | 2 | (34) | - | 1 |
| (5) | - | 4 | (15) | - | 3 | (25) | - | 4 | (35) | - | 2 |
| (6) | - | 2 | (16) | - | 4 | (26) | - | 1 | (36) | - | 3 |
| (7) | - | 3 | (17) | - | 1 | (27) | - | 4 | (37) | - | 1 |
| (8) | - | 1 | (18) | - | 2 | (28) | - | 3 | (38) | - | 3 |
| (9) | - | 2 | (19) | - | 3 | (29) | - | 2 | (39) | - | 1 |
| (10) | - | 3 | (20) | - | 4 | (30) | - | 1 | (40) | - | 3 |

(ලකුණු 80)

## II පත්‍රය

(1) (අ) (i)




(අ) (ii)







www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(ආ) (i) A - වසභ රජතුමා
B - මහසෙන් රජතුමා
C - හම්ප්‍රිඩේව්
D - පෙඩ්රික් නෝත් (ලකුණු 04)

(ii) 1 - ක්ලෝඩියස් ටොලමි
2 - ග්‍රීක රෝමානුවෙක්
3 - තප්‍රොබේන් / තප්‍රොබානා
4 - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (ලකුණු 04)

(iii) 1 - පූජ්‍ය වාරියපොළ සුමංගල හිමි
2 - 1815.03.02 / 1815 මාර්තු 02
3 - උඩරට ගිවිසුම අත්සන් කිරීම.
4 - රොබට් බ්‍රවුන්රිග් (ලකුණු 04)

(2) (i) අර්ධ ශුෂ්ක කලාපය / පහත රට වියළි කලාපය / පහත රට අතරමැදි වියළි කලාපය
තෙත් කලාපය / කඳුකර / වියළි අතරමැදි කලාපය / ශුෂ්ක කලාපය (මින් තුනක් සඳහා ලකුණු 03)

(ii) ශාක ආහාර - වල්දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටුඅල, කිතුල් ඇට, දෝතුලු ඇට මද
සත්ව ආහාර - ගවයා, කුළු හරකා, කළු වලහා, ඌරු, දඬ ලේනා, හම්බාවා, මුගටියා.... වැනි සතුන්ගේ මස්
(කාණ්ඩ දෙකෙන් දෙක බැගින් ලකුණු 04)

(iii) L මැටි ඔරු සුසානවල ආදාහනය කිරීම. පසුව භෂ්මාවශේෂ මැටි බඳුන්වල බහා ඒවා තුළ තැන්පත් කිරීම, රංචා මඩම ප්‍රදේශයෙන් සොයාගෙන ඇත. හල්දුම්මුල්ල, බෙරගලින්ද සොයා ගෙන ඇත.
L විශාල ගල්පතුරු එක් තැන් කොට චතුරස්‍රාකාර හැඩයට සුසාන සකස් කර ගැනීම.
L මළ සිරුරු තබා පුළුස්සා භෂ්මාවශේෂ මැටි බඳුන්වන්වල බහා මෙම ශිලා මංජුසා තුළ තැන්පත් කර ඇත. ඉබ්බන්කටුව, ගල්සොහොන් කනත්ත, යටිගල්පොත්ත ස්ථානවලින් සොයා ගෙන ඇත.
(කරුණු 2ක් නිදසුන් සහිත ව පැහැදිලි කිරීමට ලකුණු 05)

(iv) (a) භූ භෞතික පසුබිම, වාර්ෂික වර්ෂාපතන අගය, පසේ ස්වභාවය, භූ විෂමතාවය, ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය, ජලවහනය ........ ආදී කරුණු 02කට ලකුණු 02)

(b) L ප්‍රධාන වශයෙන් හේන් ගොවිතැන සිදු කිරීම.
L කටුසර බෝග වගා කිරීම. කුරක්කන්, මෙනේරි, තල, තණහාල් වැනි කරුණු 2ට ලකුණු 2, පැහැදිලි කිරීමට ලකුණු 2
(2 + 4 = 6)

(3) (i) A - කූට කණ්ණ අභය
B - I කාශ්‍යප
C - නිශ්ශංකමල්ල රජතුමා (ලකුණු 03)

(ii) A - නගර වුඩ්ඩිත
C - පන අදෙක
B - රූප අදෙක
D - කනපෙඩික (ලකුණු 04)

(iii) L ගමේ පොදු කටයුතුවලට නායකත්වය දීම.
L ගම් වැව් නඩත්තු කිරීම.
L වැව් ජලය බෙදාහැරීම.
L ගම්වල ආරවුල් විසඳීම.
L ගම් නායකයන් සමඟ සුහදව කටයුතු කිරීම.
(කාර්යයන් 2ට ලකුණු 02 - පැහැදිලි කිරීමට ලකුණු 03)

(iv) L එළාරගේ සොළී පාලනයෙන් මුදා ගැනීමට පිය රජතුමාගේ උපදෙස් අනුව සැලසුම් කිරීම.
L සංවිධානාත්මක ලෙස සටන් ව්‍යාපාරය දියත් කිරීම.
L මාතොට වැනි අන්තර්ජාතික වරායන් සොළී ගෙන් මුදා ගැනීම
L යුද්ධයේ දී මිනිස් ජීවිත හානි අවම කර ගැනීම සඳහා උපාය මාර්ග අනුගමනය කිරීම.
L තම ප්‍රතිමල්ලවයාගෙන් සොහොනට පවා නිසි ගෞරව දැක්වීම
(කරුණු 3ට ලකුණු 3 විස්තරයට ලකුණු 3)

(4) (i) A - භාතිකාභය රජතුමා
B - I විජයබාහු රජතුමා
C - ගජබාහු රජතුමා (ලකුණු 3)

(ii) A - කිරි ලබා ගැනීමට ඇති කළ ගවයන්
B - හේන් වගාවේ දී අය කළ බදු
C - කම්මල්කරුවන්
D - වෙළඳාමේ නියුක්ත පිරිස (ලකුණු 4)

(iii) L ක්‍රි. පූර්ව 2400 තරම් ඈත කාලයේ යපස් උණු කිරීමට දැන සිටි බවට සාධක ඇත. බෙරගල ප්‍රදේශයේ සොහොන් ගැබක තිබී බොර කැබැල්ලක් සොයාගෙන ඇත.
L බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙන් පැරණි යකඩ උදුන් සොයාගෙන ඇත. මෙහි උදුන් දල්වීමට ස්වාභාවික සුළං බලය යොදා ගෙන ඇත.
L සීගිරියට නුදුරු ප්‍රදේශ වූ අලකොළ වැව දෙහිගහ ඇළ කන්ද ප්‍රදේශයේ ද යකඩ උදුන් සොයා ගෙන ඇත. උදුන් සඳහා යකඩමරං ගස්වල දැව ඉන්ධන ලෙස යොදා ගෙන ඇත.
(මෙහි කරුණු 2ක් නිදසුන් සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු 5)

(iv) L නාගරික ප්‍රජාව තුළ වාර්ගික, ආගමික කණ්ඩායම්වලට අයත් ජන කොටස් එක්ව වාසය කර ඇත.
දෙමළ, ග්‍රීක, අයෝනියන්, කාම්බෝජ, ජාටක වරු වෙළඳුන් ලෙස පැමිණ සහයෝගයෙන් වාසය කර තිබීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

L දෙමළ ජාතික භික්ෂූන් වහන්සේ කෙනෙකු පිළිබඳ අභයගිරියේ සෙල්ලිපියක තොරතුරු දක්වේ.

L සිංහල කාන්තාවන් දෙමළ ජාතිකයන් සමග විවාහ වීම අම්පාර දිස්ත්‍රික්කයේ පැරණි සෙල්ලිපියක සඳහන් වේ.

L රාජ්‍ය සභාවේ දෙමළ අධිකාරී නමින් තනතුරක් තිබීම. දෙමළ ජනයාගේ සුභසාධානය පිළිබඳ සොයා බැලීම සඳහා

L රජවරු අගම්පඩි සේනාපල (කේරළ දේශයෙන් පැමිණි) සහය ලබා ගැනීම.

L I විජයබාහු රජතුමා දළදා මාළිගාවේ ආරක්ෂාව වේලක්කාර හමුදාවට බාරදීම (කේරළ දේශයේ)

L විවිධ වෙළඳ කණ්ඩායම් හමුවට බාර දීම. (මෙවැනි කරුණු 3ක් නිදසුන් සහිතව පැහැදිලි කිරීමට ලකුණු 06)

(5) (i) a - අනුරාධපුරය (ලකුණු 01)

b - දඹදෙණිය, යාපහුව, කුරුණෑගල ගම්පල, කෝට්ටේ

(මින් දෙකකට ලකුණු 02)

(ii) L දුර්වල පාලකයන් බලයට පත්වීම

L කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය

L සතුරු ආක්‍රමණ (කාලිංග මාඝ ආක්‍රමණය)

L මධ්‍යගත පාලනය බිඳ වැටීම.

L ආරක්ෂාව නැතිවීම.

L වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම.

L මැලේරියා වංසංගතය පැතිරීම.

L ජනතාව / භික්ෂූන් වහනසේලා වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම.

(කරුණු 2කට ලකුණු 04)

(iii) (a) අභියෝග

L නීත්‍යානුකූල රජ්‍ය උරුමයන් නැති වීම.

L උඩරටට එල්ලවන පෘතුගීසි ආක්‍රමණවලින් ආරක්ෂා කර ගැනීම.

L සීතාවක රාජ්‍යයෙන් එල්ලවන බලපෑම්වලින් මුදා ගැනීම.

L පරිහානියට පත් වූ බුදු සසුන ආරක්ෂා කිරීම.

L උඩරට ආර්ථිකය සමෘද්ධිමත් කිරීම

(මින් කරුණු 02කට ලකුණු 02)

(b) රාජ්‍ය උරුමය තහවුරු කරගැනීමට සිහසුනට උරුම ඇති කුසුමාසන දේවි කුමරිය විවාහ කර ගැනීම.

L රෝමානු කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳ ගැනීම

L මහනුවර දළදා මාළිගාවක් තනවා දන්තධාතූන් වහන්සේ වැඩම කරවා එහි තැන්පත් කරවීම.

(මෙවැනි කරුණු අතරින් 3ක් සඳහා ලකුණු 03)

(iv) L ස්වයංපෝෂිත එකක් වීම / පරිභෝජනය පදනම් කර ගත් එකක් වීම / හේන් ගොවිතැන සඳහා වැඩි ඉඩම් ප්‍රමාණයක් යොදාවා ගැනීම / ගෙවතුවල කොස්, දෙල් අල බතල, සාදික්කා, කරදමුංගු පලතුරු එළවළු වගා කිරීම / යකඩ, දැව, පන්, පිත්තල, ලාක්ෂා කර්මාන්ත දියුණුවට පැවතීම. (මෙවැනි කරුණු 3ක් සඳහා ලකුණු 3 ඒවා පැහැදිලි කිරීමට ලකුණු 3)

(6) (i) A - ෆන් එංගල් බෙක්

B - පෙඩ්රික් නෝර්ක්

C - ජෝන් ඩොයිල් (ලකුණු 3)

(ii) L ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහුණ ලා පිහිටා තිබීම.

L ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ නාවික බලය ආරක්ෂා කර ගැනීම සඳහා පහසු වීම.

L ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගත හැකි වීම.

L විශාල, ස්වාභාවික වරායක් වීම.

(කරුණු 2ට ලකුණු 04)

(iii) (a) මොනරවිල කැප්පෙටිපොළ, මඩුගල්ලේ, කිවුල්ගෙදර මොහොට්ටාල බූටැවේ රටේ රාළ, දෙදෙනෙක් ලකුණු 02)

(b) සටන සංවිධානාත්මක නොවීම ඉංග්‍රීසීන් අනුගමනය කළ දැඩි මර්ධනකාරී ප්‍රතිපත්තිය / රදළයන් අතර තිබූ පෞද්ගලික එදිරිවාදිකම් / සටන සඳහා අවශ්‍ය හොඳ අවි ආයුධ, සම්පත් ආදිය නැතිවීම / රජු හැටියට පෙනී සිටි විල්බාවේ දොරේ සාමි නැමැත්තාට රාජ උරුමයන් නැති බව හෙළිවීම ..... වැනි (කරුණු අතරින් කරුණු 3කට ලකුණු 03)

(iv) L මුද්‍රණාල පිහිටුවීම (ලංකාභිනව, විශ්‍රුත, කවටකතික, සුදර්ශන, සිරස සඳරැස් ආදී)

L සඟරා හා පුවත්පත් මුද්‍රණය කර බෙදාහැරීම. (ලක්මිණි පහන, ලංකා ලෝකය, සිංහල ජාතිය වැනි)

L ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම (බද්දේගම, වරාගොඩ,උදම්විට, ගම්පල, පානදුරා...)

L බෞද්ධ පාසල් පිහිටුවීම (ආනන්ද, ධර්මරාජ, මහින්ද ...)

L බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම මෙවැනි ක්‍රියා මාර්ග 3ක් සඳහා ලකුණු 03 විස්තරයට ලකුණු 03)

(7) (i) කෝපි, කෝකෝවා, සිංකෝනා, තේ, රබර්, පොල් (තුනකට ලකුණු 03)

(ii) A - කෝල්බෲක්

B - කෲව් මැකලම්

C - මැනිං

D - ඩොනමෝර්



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) L මධ්‍යම පන්තියක් බිහිවීම.
L කම්කරු පන්තියක් බිහිවීම.
(කරුණු 2ට ලකුණු 02, විස්තරයට ලකුණු 03)

(iv) L ජාත්‍යන්තර භාෂාවක් වූ ඉංග්‍රීසි භාෂා දැනුම
L අපනයන වැවිලි බෝග හඳුන්වා දීම.
L ගමනාගමන කටයුතු දියුණුවීම (මහාමාර්ග / දුම්රිය මාර්ග)
L සන්නිවේදන කටයුතු දියුණු වීම.
L පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
(මෙවැනි කරුණු 3ක් සඳහා විස්තරයට ලකුණු 03)

### III කොටස

(8) (i) A - මයිකල් ඇන්ජිලෝ
B - ගැලීලියෝ ගැලලි
C - අයිසෙක් නිව්ටන්
L ලෝකය / පෘථිවිය ගෝලාකාර බව දැන සිටීම.
L ටොලමි විසින් අඳින ලද ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ දැන ගැනීම.
L මාලිමා යන්ත්‍රය හා උතුරු තරු මාපකය පිළිබඳ දැනුම ලබා තිබීම.
L ජාතික රාජ්‍යයන් මුහුදු ගමන් සඳහා ආධාර ලබා දීම.

(iii) (a) L විලියම් හාවේ-මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු සොයා ගැනීම
L පැරසල්සස් - විසින් ලෙඩ රෝග සෑදීමට හේතු ඒවාට ප්‍රතිකර්ම අත්හදා බැලීය. ඉහත ඖෂධ විද්‍යාව හා රෝග චිකිත්සක ක්‍රම කෙරෙහි බලපෑම් කිරීමට සමත් විය.
L මයිකල් සර්වෙටස්-රුධිරය පිරිසිදු වීමේ ක්‍රියාවලිය පිළිබඳ සොයා ගැනීම.
L ලියනාඩෝ ඩාවින්චි-මිනිස් සිරුරේ අවයව පිළිබඳ චිත්‍ර, හරස් කඩ, නිර්මාණ ඉදිරිපත් කර ඇත.
(කරුණු දෙකට ලකුණු 02)

(b) L ආරුක්කු හැඩ
L උස් කුළුණු
L අර්ධ ගෝලාකාර ශිඛර ලක්ෂණ එකතු වීම.
L සුඛෝපභෝගී මන්දිර තැනීම.
L අලංකාර දේවස්ථාන ඉදි කිරීමට විශේෂ සැලකිල්ලක් දැක්වීම.
(කරුණු 3කට ලකුණු 03)

(iv) L ලංකාවට පැමිණ පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසින්ගෙන් යුරෝපා පුනරුදයේ බලපෑම ලංකාවට ලැබුණි. දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික අංශවල වෙනස්කම් ඇති විය.
L රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ලැබීම.
L පැරණි නිලතල ධූරාවලිය වෙනුවට නිලධාරි පන්තියක් හා පරිපාලන ආයතන බිහිවීම.
L නීති රීති වෙනස් වීම.
L වතු වගාව ව්‍යාප්ත වීම.
L ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම.
L රටතුළ ප්‍රවාහන, සන්නිවේදන, බැංකු ආදී යටිතල පහසුකම් ස්ථාපිත වීම.
L මධ්‍යම පන්තියක් බිහිවීම.
L කම්කරු පන්තිය බිහිවීම.
L බටහිර සංස්කෘතිය අංගය පැතිරීම. (කෑම බීම / ඇඳුම් නම් ගම්)
L ඉංග්‍රීසි අධ්‍යාපනය හා ඉංග්‍රීසි භාෂාව ලැබීම
L විනෝදාංශ, සංගීතය, නැටුම්, ක්‍රීඩා ආදී විවිධ අංශවල දියුණු වීම.
(මෙවැනි කරුණු 3කට ලකුණු 03, විස්තරයට ලකුණු 03)

(9) (i) ප්‍රංශය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ජර්මනිය, රුසියාව, (වැනි රටවල් අතරින් රටවල් 8ක් සඳහා ලකුණු 03)

(ii) A - ජේම්ස් හාග්‍රීව්ස්
B - හෙන්රි බෙස්මර්
C - විලියම් සීමන්ස්
D - ජෝන් ලොගී බෙයාර්ඩ්

(iii) L මහා පරිමාණ ගොවිබිම් ආරම්භ කිරීම
L ශෂ්‍ය මාරු ක්‍රම හඳුන්වා දීම.
L සත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම.
L කාෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම
L පොහොර වර්ග හා රසායනික ද්‍රව්‍ය පිළිබඳ සොයා ගැනීම (කරුණු 2කට ලකුණු 2, විස්තරයට ලකුණු 3)

(iv) L නව රැකියා අවස්ථා උදාවීම.
L විවිධ භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීම නිසා ජීවන තත්ත්වය ඉහළ යාම
L නගර බිහිවීම, නගර යටිතල පහසුකම් සංවර්ධනය විම
L පන්ති සහිත සමාජයක් බිහිවීම.
L කම්කරුවන් සඳහා නගරවල පේලි නිවාස, මුඩුක්කු නිවාස, අඩු පහසුකම් නිවාස බිහිවීම.
L සමාජ දුරාචාර පැතිරීම
(මෙවැනි කරුණු 3ක් සඳහා ලකුණු 3 විස්තරයට ලකුණු 3)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources